# සංස්කෘතිය ආධ්‍යාත්මික සබැඳියාව හා තිරසාර සංවර්ධනය


**ඩී.මනෝජා ජයසේකර**
(පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය)

ගහකොළ, තුරුලතා සතා සිව්පාවුන් මෙන්ම මිනිසා ද අපූරු විශ්වයේ කොටස්කරුවන් ලෙසින් සියලු දායාදයන් භුක්ති විඳිමින් ජීවත්වනු දැකීම ම කෙතරම් සතුටක් ද? ගහකොළ වන සතුන්ට සාපේක්ෂව, මිනිසා බුද්ධි වර්ධනයෙන් ඉදිරියෙන්ම සිටින බැවින්දෝ මානවයා විටකදී හුදෙක් ගහකොළ වන සතුන් ගේද, භූමියේද, සතුරන් ලෙසින් හැසිරෙනු දැකීම කෙතරම් අවාසනාවක් වන්නේද? කාලීන වශයෙන් සිදුව ඇති පාරිසරික ව්‍යසනයන්හි නියමුවා මිනිසා වීමේ ප්‍රතිඵලයක් ලෙසින් අද වන විට ලොවපුරා අතොරක් නැතිව භූකම්පන, නායයෑම්, සුළි කුණාටු, ටොනාඩෝ, එල්නිනෝ (El-nino), සුනාමි ලෙසින් හඳුනාගත් නම් වලින් පෘථිවි සම්පත් මොහොතින් උදුරාගන්නා විපර්යාසයන් අභිමුවේ අපට හුදකලා වීමට සිදු වී තිබෙනු දැකිය හැකියි.

21 වන සියවස වනවිටදී මෙකී ව්‍යසනයන්හි වේගවත් වර්ධනය නිසා පරිසරයට හිමිවිය යුතු නිසි තැන දීමට මිනිසා පෙළඹුණි. එබැවින් ශබ්දකෝෂයන්ට නව වචන එකතුවෙමින් විශ්වකෝෂය හා බැඳුණු තිරසාර සංවර්ධනය, ජෛව විවිධත්වය, ස්ථානීය සංරක්ෂණය ආදී නොයෙක් උපක්‍රමයන් අප හා එක් වී ඇත. මේ සියලු නිර්ණායකයන් තුළින් අපේක්ෂා කරනුයේ හෙට ඉපදෙන දරුවාට සුපිරි ලොවක් දායාද කරදීමටයි. ඒ අතරින් වඩාත් කාලීන ආන්දෝලනයට ලක්ව ඇති තිරසාර සංවර්ධනය තුළින් අපේක්ෂා කරනුයේ පවතින සම්පත් අනාගතයට ඉතිරි කරදීමයි. මෙය සාර්ථක කර ගැනීමේ උපාය මාර්ගයන් ලෙසින් ගසක් වවා රටක් හදමු, නිල්ල පිරුණු රටක් - පැහැබර අනාගතයක්, පුංචි පවුල රත්තරන්, ආදී තේමාවන් අප අතරට එක්ව ඇත.

සන්නිවේදනය නොදියුණු පුරාතණ අතීතයේ ද ආදි මුතුන් මිත්තන් යහපත් හෙටක් උදාකරදීම සඳහා අද දිනය යහපත් කරගැනීමේ වටිනා කාර්යය සඳහා ඇපකැපවී කටයුතු කර ඇති බවට දෘශ්‍යමාන වන පුරාතණ සාක්ෂි අපට ඉතිරි කොට ඇත. එම සාක්ෂි අද අපට වෙස්වලාගත් දේව ආශිර්වාදයක් වී ඇත.

අතීතයේ සංස්කෘතිය, සංවර්ධනය, ආධ්‍යාත්මය දියුණු කිරීම උදෙසා නොදියුණු සන්නිවේදන මට්ටමක සිට වුව ද ඉතා කාර්යක්ෂමව කටයුතු කර ඇති බව දාගැබ්, වෙහෙර විහාර, උයන් වතු මණ්ඩප සාක්ෂි දරයි. උදාහරණයක් ලෙසින් මදකට රිටිගල වැනි ආරණ්‍ය සේනාසනය වෙත මනස ගෙන යන්න. එම පුදබිමේ ඇති පුස්තකාල, ඔසු උයන්, ගිලන් මධ්‍යස්ථාන, රාජ සභා නිර්මාණයන් සිදුකර ඇති අකාරය, භික්ෂු විනය මානසික ඒකාග්‍රතාවය සඳහා ජීවත්වන ලෙනගල, කැසිකිළිය පවා මනා ශික්ෂණයක් ඇතිව එම ශරීර කෘත්‍යයන් සිදුකළ යුතු ආකාරය පිළිබඳ පෙර පුහුණුව ලබාදෙයි. සක්මන් මලුව පවා ශාරීරික සුවතාව හා ආගමික සැබැඳියාව ඇතිවන ලෙස සිදුකිරීමට මඟ පෙන්වයි. වටිනා ඔසු උයන් රිටිගල වන භූමිය තුළ ඇත. කෘත්‍රිම ශිතකාරක කුටීර වෙනුවට පුරාතණයේ වායු සමීකරණ කාමර ද ඉදිකර තිබුණි.



එම කුටීර අද මෙන් කෘත්‍රිම වායුකාරක භාවිතයෙන් තොරවූ හුදෙක්ම ගල් කණු හා ස්වභාවික ජලය පමණක් භාවිතා කරමින් සකසන ලද ශීත කාමර ලෙසින් ඉදිවී ඇත. ඒ තුළින් දැඩි හිරු රැසින් වන හානිය අවම කරගැනීමට පුරාතණ මුතුන් මිත්තන් සමත් වී ඇත.

වනාන්තරය රාජ්‍ය නායකයා ඇතුළු රට වැසියන් එදා දේවත්වයෙන් පුදනු ලැබීය. පුරවැසියන් ස්වභාවධර්මය හා අනුගතවෙමින් තිරසාර පැවැත්ම උදෙසා ඇපකැප වී කටයුතු කළහ. අද මෙන් නොව, නව කොන්ක්‍රීට් ඉදිකිරීම් උදෙසා වටිනා දැව සම්පත බිමට නොහෙළන ලදී. පරිසරයට අවමහානි වන ලෙසින් සියලු ඉදිකිරීම් සිදුකරන ලදී.



අදටත් ස්වභාව සෞන්දර්යයෙන් අනූන චමත්කාරජනක රෝස තිරුවානා කන්ද සහිත නාමල් උයන එකල රජ දවස රජු මෙහෙයවීමෙන් සිරකරුවන් ලවා රෝපණය කරවන ලද්දකි. මේ තුළින් තිරසාර සංවර්ධනට ඔවුන් කෙසේ ළගාවූවේද? යන්න මදක් විමසා බැලිය යුතුය. සිරකරුවන් සඳහා නා ගස් රෝපණයට පෙළඹුවේ මතු බුදුවන මෛත්‍රී බුදුන් නා ගස පාමුල බුදුවන බවට බෞද්ධාගමිකයන් තුළ පවතින විශ්වාසය සාක්ෂාත් කරගනු වස් එම සිරකරුවන්ගේ සිත්සතන් ආගමික සන්හිඳියාවට පෙළගැස්සවීම උදෙසාය. තවද ඉදිකර ඇති බෙහෙත් ඔරු, ගිලන්හල ආදිය එය තවත් ශක්තිමත් කරවන්නකි. අතීත සටහන් තුළින් මෙම භූමිය තුළ ඔවුන් උදෙසා භාවනා වැඩසටහන් දියත් කර ඇත. එබැවින් වරදකරුවා සමාජයට මුහුකිරීමට පෙර මානසික ආතතිය හා කායික තුලනය ඇති කිරීම නොදියුණු සන්නිවේදන යුගයන් තුළ පවා වඩාත් දියුණුමට්ටමින් සිදුව ඇත.


පැරණි සමාජය තුළ පැවති එකිනෙකාට ගරු කරන්නාවූ වැවයි - දාගැබයි, ගමයි - පන්සලයි, ආගමික හා සංස්කෘතික සබැඳියාව අද පවතින මුහුණු පොතෙන් අපට ලබාගත නොහැක. පැල්කවි, පාරුකවි, ගැල් කවිවලින් උකහා ගත් ආත්මීයගත වෘත්තිමය රිද්මය අදටත් අප අතර නොනැසෙමින් පුංචි දරුවාගේ පෙළපොතට ඇතුළත් කරමින් අප අද සොයා යන්නේ කුමක්ද? හුදෙක්ම උඩුගම් බලා පීනන සමාජයකට යහපත් තිරසාර හෙටක් උදා කරලීමය. එබැවින් ඉතිහාසය අනාගතයට සුදුසුම මඟ පෙන්වන පෙරගමන්කරුවාය.

ලොවටම පොදු දොරටුවක් නොතිබුණු අතීතයේ ඩොලර්, යෙන්, යුරෝ නොතිබුණු එම යුගයේ ශ්‍රී ලාංකිකයන් සහලින් ස්වයංපෝෂිත රටක්ව පෙරදිගට සහල් අපනයනය කළ බව මහා පරාක්‍රමබාහු රජ දවස සාක්ෂි දරයි. එතුමන් අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් වත් ප්‍රයෝජනයට නොගෙන අපතේ යෑමට ඉඩ නොදෙමි වැනි ධනාත්මක දර්ශනයන් සනිටුහන් කරවූවේ ද, ක්‍රියාවට නැගුවේ ද මානවයාගේ පෙර පිනටය. එය පූර්වාදර්ශයක් කර ගනිමින් අප අද වැසි ජල ටැංකි වියළි කලාපය පුරා ව්‍යාප්ත කර ඇත.

පැරණි මානවයා ජීවත්වන්නාවූ ස්වභාවධර්මය තුළින් ලබාගත් උසස්වූ මානසික සන්සුන්භාවය තුළින් ස්වයංජනනය වන්නාවූ යහපත් ආකල්ප පැවති පින්බර රටක ඉපදීමට ලැබීම ද වාසනාවකි. එහෙත් සීමිත සම්පත් තුළින් අසීමිත අවශ්‍යතා සපුරාගැනීමට වෙරදැරීම නම් ජාතියේ අවාසනාවකි. මන්ද මුදලට හා තරඟකාරිත්වයට මුහුණදෙමින් එකිනෙකා පසුකරමින් නැඟී සිටීමට උත්සහ දරණ සමාජයක කොටස් කරුවන් වීම අභාග්‍යයකි.



හෙට උපදින දරුවාට අද දින සිට තරඟයට මුහුණදීමට සූදානම් කිරීමට අප සැරසෙන්නේ නම් තරඟකරුවන් සිටින පිටියක නියතවශයෙන් ඔහු ද සිටිනු ඇත. එහෙත් සාරධර්ම, ආධ්‍යාත්මික සන්හිඳියාව, නොහඳුනන තරඟකරුවකුවීම කාන්තාරයේ මී පැණි කැවාසේය. මන්ද තිරසාර සංවර්ධනය ඇති කරන්නේ සතා සිව්පාවා නොව මිනිසාය. ස්ථිරසාර  සංවර්ධනයක් සඳහා යන ගමනේදී ආධ්‍යාත්මය, සංස්කෘතිය, සාරධර්මවලට පිටුපා යා නොහැක. තමන් අදහන ආගම තුළින් ලබාගත් ශික්ෂණය හා අතීත ප්‍රෞඪත්වය, සංස්කෘතිය හා අත්දැකීම් හඳුනාගමින් ඊට නිසි ගෞරවය ලබාදෙමින්  තිරසාර ලොවක් ගොඩ නැංවීමට මේ සුදුසුම කාලයයි.




පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

"සම්පත්පාය"

අංක 82

රජමල්වත්ත පාර

බත්තරමුල්ල

web : www.environmentmin.gov.lk

e-mail : pedudivision@gmail.com

Phone/Fax : 011-2863652